FCSOK FEDERATION OF CIVIL SOCIETY ORGANIZATIONS KATTANKUDY

133/1, Old Road, Kattankudy 4. Tel: 0777 655569, 0777 563496 Mail: fcsoksrilanka@gmail.com

# කාත්තාන්කුඩි සිවිල් සංවිධාන සම්මේලනය විසින් 2019.04.25 දින නිකුත් කරන ලද නිවේදනය

මෙය අපගේ මව් රට බරපතල ඛේදවාචකයකට මුහුණ දී තිබෙන අවස්ථාවකි. රටේ විවිධ ප්‍රදේශවල සිදුවූ ම්ලේච්ඡ ත්‍රස්තවාදී ප්‍රහාර නිසා අපගේ ක්‍රිස්තියානි සහෝදර සහෝදරියන් හා සමහර අහිංසක පිටරට වැසියන් දිවි අහිමිව මහත් ශෝකජනක තත්වයකට රට මුහුණ දී ඇත. ත්‍රස්තවාදයේ ගොදුර වී දිවි අහිමි වුණු හා රෝහල්වල ප්‍රතිකාර ලබමින් දුෂ්කරතාවලට මුහුණ දෙන සියලුදෙනා පිළිබඳව අපගේ සිත් මහත් කම්පාවට පත්ව තිබේ. දිවි අහිමිවූ සියලුදෙනා වෙනුවෙන් ඔවුන්ගේ පවුල්වලට ශෝකය පළ කිරීම සඳහා මෙම නිවේදනය නිකුත් කරන්නෙමු. ප්‍රතිකාර ලබන සියලුදෙනා ඉතා ඉක්මනින් සුවපත් වීමට ප්‍රාර්ථනා කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව කවදත් සාමයට ලැදිව හා රටට විශ්වාසයෙන් කටයුතු කළ අය වේ. අපගේ ජනතාව පල්ලියේ දී දෙවියන් නමදිමින් සිටිය දී ඝාතනය කෙරුණු අවස්ථාවේ දී, ඔවුන්ගේ දේපල විනාශ කරන ලද අවස්ථාවේ දී හා තමන්ගේ බිම්වලින් පලවා හරින ලද අවස්ථාවේ දී, ඔවුන් තම රටට එරෙහිව හෝ රටේ ජනතාවට එරෙහිව ක්‍රියා නොකළේය. ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ ප්‍රචණ්ඩත්වය නොව සාමයයි.

නැගෙනහිර ප්‍රදේශයේ විශේෂයෙන් කාත්තාන්කුඩියේ වෙසෙන මුස්ලිම්වරුන් පසුගිය යුද වකවානුවේ දී ඉතා ඛේදජනක තත්වයන්ට මුහුණ දුන් අවස්ථාවේ දී රටට පක්ෂපාතී ස්ථාවරයක් ගෙන, සහෝදර  බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සමාජයන් සමග එකමුතුකම නැවත ගොඩනැගීමට නොපමාව ක්‍රියා කළ බව සිහිපත් කළ යුතු වේ.

එහෙත් පසුගියදා කොච්චිකඩේ, මීගමුව හා මඩකලපුව ප්‍රදේශයන් හි ක්‍රිස්තියානි පල්ලිවලට හා ප්‍රසිද්ධ හෝටල්වලට එල්ලකෙරුණු බෝම්බ ප්‍රහාරයන් අපව නැවතත් අපකීර්තිමත් තත්වයට පත්කර ඇත. අප දැඩි සේ ලැජ්ජාවට පත්වන්නෙමු. සුළු ප්‍රමාණයේ ත්‍රස්තවාදීන් සංඛ්‍යාවක් කාත්තාන්කුඩියේ සිට ද මෙම ත්‍රස්ත ක්‍රියාවලට සම්බන්ධවීම පිළිබඳ ආරංචිය සිතට ගෙන දෙන්නේ දැඩි වේදනාවයි.

කාත්තාන්කුඩිය එහි ඉතිහාසයේ කිසිම මොහොතක මෙම නපුරු බලවේග පිළිගත්තේ නැත. ඔවුන්ව අනුමත කළේ නැත. මෙම ත්‍රස්ත ප්‍රහාරවල ප්‍රධාන සැකකරු ලෙස සැලකෙන සහ්රාන් හාශිම් නැමැත්තා කාත්තාන්කුඩි ජාමියතුල් ෆලාහ් අරාබි

විද්‍යාලයෙන් ඉවත් කරන ලද සිසුවෙකි. ඔහුගේ විකෘති හැසිරීම නිසා ඔහු විද්‍යාලයේ පරිපාලනය විසින් 2005 දී විද්‍යාලයෙන් නෙරපා හරින ලදී.

ඉන්පසු ඔහු ස්වයං ලෙස තමාගේ රැඩිකල් උසිගැන්වීම් කථා දිගටම පවත්වමින් සිටියේය. කාත්තාන්කුඩියේ වැදගත් සංවිධාන කිහිපයක් ඔහුව හෙළා දැක ඔහුගේ රැඩිකල් ද්වේෂ කථා නවත්වන ලෙස අවධාරණය කරන ලදී. මෙම ක්‍රියාව ඉදිරියටත් කිරීමෙන් වලකින ලෙස කාත්තාන්කුඩි ජනතාව වෙනුවෙන් දැඩි ලෙස ඉල්ලීම් කරන ලදී. තවද ඔහුගේ ප්‍රචාරක මධ්‍යස්ථානයේ දී ඔහුගේ කථා පැවැත්වීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අනුමැතිය ලබා නොදෙන ලෙස පොලිසියට පැමිණිලි කරන ලදී.

2017 වසරේ දී සහ්රාන්ගේ ත්‍රස්තවාදය උසිගන්වන කථා නිසා ඇති වූ ප්‍රචණ්ඩත්වය හා කණ්ඩායම් ගැටුම් නිසා ඔහුගේ සහායකයින් අත්අඩංගුවට ගෙන මඩකලපුව මහේස්ත්‍රාත් විසින් මාස 6 ක කාලයක් සිරගත කරන ලදී. එම අවස්ථාවේ දී සහ්රාන් මෙම ප්‍රදේශයෙන් පලා ගොස් සැඟවී සිටියේ ය. එහෙත් මෙම ඛේදජනක සිදුවීම් සිදුවනතෙක් ඔහුව අත්අඩංගුවට නොගැනීම කණස්සල්ල ඇති කරයි.


ඔහු හඳුනා නොගත් ප්‍රදේශයක සැඟවී සිටිමින් තමාගේ දූෂ්‍ය ප්‍රචාරයන් සමාජ මාධ්‍ය මඟින් දිගටම සිදු කළේය. රටේ සාමයට හා ආරක්ෂාවට දැඩි අනතුරක් ඇති කරන බව ඔහුගේ දරුණු කථාවන් හඳුනාගනු ලැබූ අවස්ථාවේ දී අප ආරක්ෂක නිළධාරීන් වෙත මේ පිළිබඳව දැනුම් දුන්නෙමු. අප සමාජයේ බොහෝ ප්‍රබලයින් විසින් පැමිණිලි ගණනාවක් සිදු කරන ලදී. එහෙත් ඔහුගේ ක්‍රියාකාරකම් නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගත් බව සිතේ. මෙවැනි නොසලකා හැරීම් හා ඔහුව අත්අඩංගුවට නොගැනීම අපට වටහාගත නොහැකිව පැවතුණි. මෙය අපගේ කණස්සල්ලට හේතු විය.

මෙම ත්‍රස්තවාදයේ කෲරත්වය පිළිබඳව අප කිසිවෙකු නිසි ලෙස තක්සේරු නොකළ හෙයින් හා ත්‍රස්තවාදීන්ගේ ඉතා සූක්ෂම සැලසුම් හා ක්‍රියාකාරකම් අපට නිසිලෙස තේරුම් ගැනීමට නොහැකිවූ නිසා අද මෙවැනි තත්වයන්ට මුහුණු දීමට සිදුවූ බව සිතන්නෙමු.


වර්තමානයේ ඔහු අප සියලුදෙනාට දැඩි අනතුරක් බවට පත්ව ඇත. ඔහු මිය ගිය බවට ද පැවසේ. මෙවැනි ම්ලේච්ඡ, ත්‍රස්තවාදී ක්‍රියා අනාගතයේ නැවතත් සිදුනොවන ලෙස වැලැක්වීමට නම් අප ඉතා අවධානයෙන් හා විමසිල්ලෙන් සිටිය යුතුව ඇත. ලෝකයේ විවිධ ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වන ත්‍රස්තවාදී සංවිධානයක් මෙම ප්‍රහාරවල වගකීම භාරගෙන සිටින තත්වයක අප තවත් අමතර අවධානයෙන් සිටීම අවශ්‍ය වේ. මෙම සංකීර්ණ තත්වය වෙනත් සමාජ විරෝධි බලවේග තමන්ට වාසි ලෙස යොදාගෙන සමාජය තුළ වාර්ගික ගැටුම් උසිගන්වා රටේ වාර්ගික සමඟියට හා ජාතික සංහිඳියාවට හානි සිදු කිරිමට ඉඩ තිබේ.

වගකිවයුතු සිවිල් සමාජ සංවිධානයක් ලෙස ශ්‍රී ලංකානු සමාජයට පණිවිඩයක් ලබාදීම අවශ්‍ය වේ. ලාංකීය මුස්ලිම්වරුන් කිසිම ස්වරූපයේ ත්‍රසතවාදයක් අනුමත කරන්නේ නැත. තවද සාමකාමී ලංකාවක් බිහිකිරීම සඳහා වැහැසවී ක්‍රියා කිරීමට ඔවුන් සූදානම්ව සිටිති. සාමය හා සංහිඳියාව සහතික කිරීම සඳහා උරෙන් උර ගැටී  ක්‍රියා කිරීමට සූදානම්ව සිටින්නෙමු.

අද දින පීඩා විඳින අපගේ ක්‍රිස්තියානි සහෝදරයින්ගේ වත්මන් මනෝභාවය හා ඔවුන්ගේ වේදනාවන් අපට ඉතා දැඩිව හැඟේ. දිවි අහිමිවූ පවුල් වෙනුවෙන් හා දැනට රොහල්වල ප්‍රතිකාර ලබන සහෝදරයින් වෙනුවෙන් දෙවියන්ගෙන් ප්‍රාර්ථනා කරන අතර, ක්‍රිස්තියානි සමාජය මෙවැනි  ඛේදජනක තත්වයක දී පවා තමන්ගේ සමාජ අනුකූලතාවයෙන් හා ඉමහත් මානව ගුණාංගයෙන් කටයුතු කිරීම පිළිබඳව අපගේ ස්තූතිය ප්‍රකාශ කරන්නෙමු.



**MBM Firthous (Naleemi)**
President



**MACM Jawahir**
Secretary